# සෙනසුරු ගෝචරයේදී බෙල්ලෙන් අල්ලා මුල්ලෙන් තියනවා... බිමටම වට්ටනවා... ගැලවෙන්නේ මෙහෙමයි...



**පෙර ලියූ ලිපි අනුව සෞරග්‍රහ මණ්ඩලයේ කම්කරුවකු නියෝජනය කරන දුර දීර්ඝ අවබෝධය ජීවිතයට උදාකිරීමට සමත් නම ඇසූ පමණින් ඇස් උඩ තියාග න්නා සෙනසුරු ග්‍රහයා ගැන තව තවත් ඔබව දැනුවත් කළ යුතුයි කියා මට සිතුණේ බොහෝ දෙනාගේ දැනුමට මෙන්ම ප්‍රායෝගිකව ජීවත් වන අයුරු සෙනසුරු හරහා උදාවන නිසාවෙනි. බොහෝ අවස්ථාවල සෙනසුරු අපට පාඩම් කියා දෙන්නේ සසර ගනුදෙනුවලින් කිසිම ගැලවීමක් අපට නැත යන කරුණු කාරණා පදනම් කරගෙනය. නමුත් කේන්ද්‍ර පරීක්ෂාවේදී ජන්මියා කෙතරම් දුරට අසරණ වන්නේද, එතරම්ම දුරට පෙරළා ශක්තිමත් වීමට ධෛර්යය සිත් තුළට කාවද්දවමින් බව ඔබ දන්නේ නැතිව ඇති. ඒ නිසා දෛවෝපගත සිදුවීම් දරාගැනීමට සෙනසුරු තරම් පාඩම් කියා දෙන්න කිසිදු ග්‍රහයෙක් සමත් වන්නේද නැත.**

සෑම අවුරුද්දකට සැරයක් මෙම සෙනසුරු වක්‍ර වීම හෙවත් තමා සිටි රාශියෙන් පසුපසට ගමන් කිරීම සිදුවන්නේය. මෙම සෙනසුරුගේ වක්‍ර වීම සෙනසුරුගේ ස්වභාවය ලෙස සැලකේ. සෙනසුරු ආපසු හැරුණු තැන සිට අංශක 7ක් හෝ 8ක් ආපස්සට ගමන් කර නැවතී නැවත ඉදිරියට යෑමට පටන් ගන්නේය. එබැවින් යම් රාශියක තැන්පත් සෙනසුරු මුල් අංශක 7ක් හෝ 8ක් යෑමට කලින් වක්‍ර වූයේ නම් එවිට එය නවතින්නේ එයට මුල රාශියේද අග අංශක කිහිපයක් දුර ආපසු ගොසින්ය. නමුත් යම් රාශියක සෙනසුරු අංශක 8කට වඩා දුරට ගොස් වක්‍ර වී නම් එවිට එම රාශිය තුළම වක්‍ර වීම හා නිවෘත වීම ඒ කියන්නේ ආපස්සට ගොස් නැවත ඉදිරියට පැමිණීම එකවර සිදුවන්නේය. මේ වක්‍ර ගමන නිසා සෙනසුරුට බොහෝ විට සෑම රාශියකම අග හෝ මුල අංශකවල ළඟ ළඟම තුන් වාරය බැගින් ඉදිරියට හා ආපස්සට ගමන් කිරීමට සිදුවනු ඇත. මේ ක්‍රමයට රාශි දෙකක සම්බන්ධයක් නැතිව සෙනසුරු යම් රාශියකට ඇතුළු වූ විට එම රාශිය තුළම පමණක් අවුරුදු පතා වක්‍ර වෙමින් ගමන් කර ඊළඟ රාශියට පැමිණ අනු වක්‍ර නොවී ගමන් කිරීමක්ද සෙනසුරුගේ ගෝචරයේදී සිදුවීම ඉතා ප්‍රබල බලපෑමක් මනුෂ්‍ය ජීවිතයට එල්ල වන බවක් මෙහිලා සඳහන් කළ යුතුමය. එවිට සෙනසුරුගේ බලපෑම තමා සිටි රාශියට අනුව අවුරුදු දෙකහමාරක් නොව අවුරුදු 2යි මාස 2න් පමණ කාලයකදී සෙනසුරුගේ රාශි මාරුව සිදුවන්නේය. සෙනසුරුගේ වක්‍රය හා නිවෘත වීම යන කාරණා දෙකම හසුවූ විට එක රාශිය දෙවාරයකට හෝ ඇතැම් විට තුන් වාරයකටම ගමන් කළ කාල පරාසය අවුරුදු දෙකහමාරත් අවුරුදු තුනහමාරත් දක්වා දීර්ඝ වන බව ඔබ දන්නේද?

රාශියේ අග කොටසේ ගමන් කරන කාල පරාසය තුළදී සෙනසුරුගෙන් ජන්මියාට ගෙන දෙන්නා වූ සෙනසුරුගේ ගෝචර ඵල විපාක වැඩි වන්නේ මෙකී කරුණු කාරණා පදනම් කරගෙනය. එම වකවානුව තුළදී සෙනසුරුගේ දඬුවම්, පීඩන, අක්‍රමිකතා, රෝගාබාධ මෙන්ම ඇතැමුන්ගේ පිහිටීම අනුව ජීවිතය උඩු යටිකුරු වී යන අවස්ථාද, දැඩි සත්කාරයේ දුක් විඳ අවසන් හුස්ම හෙළීම පවා සිදුවන අවස්ථාද අපට දැකගන්නට ලැබී තිබේ.

ශනිගේ ගෝචරය ලග්නය හරහා ගමන් කරන කාලය ජන්මියාට ශුභ ඵල හීන කිරීම සිදුවේ. තමා නොකළ වැරැදිවලට හසුවීම, නමට කැළලක් වන දෑ සිදුවීම, තිබුණු ප්‍රසිද්ධිය නැතිවීම, සමාජයේ පිළිගැනීම පෙරට වඩා අඩුවී යෑම, අඳුරට මුල්ල මුළු ගැන්වූ ස්වභාවයක් ඉස්මතු වීම, උසස් අයගෙන් තමන්ට විපත්ති කරදර ඇතිවීම, පවුලේ අයගෙන් ඈත්වී වාසය කිරීමට සිදුවීම, පදිංචියේ වෙනසක් සිදුවීම, තමාට වඩා පහත් තමන්ට සුදුසු නැති අය සමග ආශ්‍රය කිරීමට යොමුවීම, නඩුහබ කරදර ඇති වුවහොත් එයින් පරාජයට පත්වීම හෝ දඬුවමට යටත් වීමට සිදුවීම, බලාපොරොත්තු රහිත වියදම් දැරීමට සිදුවීම, ක්‍රමයෙන් විපත්ති අනතුරුවලට මුහුණපෑමට සිදුවීම, තදබල ලෙස සිතට කරදර ඇතිවීම, තම පවුලේ කෙනකුට රෝගී තත්ත්වයන් උත්සන්න වීම, අන්සතු දේපළට තදින් ආශා කිරීම, සොරකම් කොල්ලකෑම් ආදී අධාර්මික අප්‍රසිද්ධ ජීවිත ගතකිරීමට සිදුවීම, තමා සතු ධනය වස්තුව අහිමි වී යෑම, ලග්නයේ ශනි ගෝචර ගමනින් ගමන් කිරීමෙන් මෙවැනි දෑවලට ජන්මියාට මුහුණ පෑමට සිදුවන්නේ තමා කිසිසේත්ම නොසිතන නොපතන අයුරින්මය. ශරීර ශක්තිය යහපත් නොවීම, කලක සිට අසනීපයෙන් පෙළෙන අයෙකු නම් එකී අසනීප තත්ත්වයන් වැඩි වීම, පාදවල ආබාධ වැඩිවීම, ජල බිය, ගිනි බිය, සතුරු බිය ඇතිවීම, කරගෙන ආ කටයුතුවල ක්‍රමවත් බව ගිලිහී යෑම, තිබුණු ලැබුණු ආදායම් තත්ත්වය පහළ වැටීම, ආර්ථික අපහසුතා උත්සන්න වීම, රැකී රක්ෂා අහිමි වීම, සිටි තනතුරුවලින් පහළට වැටීම, වැඩ ප්‍රමාදය, තමාට අවශ්‍ය වේලාවට ප්‍රයෝජන නොලැබීම, යම් දෙයක් කිරීම හෝ කරගැනීමට කිහිප වතාවක් ඒ වෙනුවෙන් රස්තියාදු වී වැඩ ප්‍රමාද වීම, උත්සාහයේ තරමට ප්‍රතිඵල හීන වී යෑම, දක්ෂකමේ තරමට තමාට තැනක් නොලැබී යෑම, ක්‍රියාවේ ශ්‍රේෂ්ඨත්වය තිබූ පමණින් ඊට සරිලන පරිදි ප්‍රසිද්ධිය, ගෞරවය, නම්බුව, තත්ත්වය නොලැබී යෑම, අඹු-සැමි සබඳතා අක්‍රිය වීම, ආකර්ෂණය අඩුවීම, දෙදෙනා අතර මතභේද මත ගැටුම් වැඩි වීමද මෙහිදී දැකගත හැකිය.

මෙහිදී මා සඳහන් කළේ ජන්මියාගේ ලග්න රාශිය තුළ ගෝචර ගමනේදී සෙනසුරු උදාකිරීමට සමත් විපත් කරදරවලින් බිඳකි. නමුත් බිය විය යුත්තේ මෙකී කාරණා මේ ආකාරයෙන්ම සිදුවන්නේ නම් පමණි. මෙකී අශුභ ඵල අඩුවීම, වැඩිවීම, අහෝසි වී යෑම ආදියද සිදුවන්නේය. මෙහිදී පොදු කරුණු මත මෙන්ම ජන්ම කේන්ද්‍රයේ මෙකී තත්ත්වයන් වෙනස් වන අයුරුද මේ අතර පිහිටීමෙන් ඉහත කී අශුභ ඵල අවම වනු ඇත.

- මකර-කුම්භ-තුලා යන මෙයින් එක් රාශියක් ලග්නය වී ශනි එම ලග්නයේ ගමන් කරන කාලයේදී යටකී තද අපල ඇතිවීමට ඉඩ නොයෙදේ. නමුත් කරදර සහිතව ජීවිතය ගලා යෑමට ඉඩකඩ යෙදේ. ශුභ අශුභ මිශ්‍ර විපාක හිමිවේ.
- ජන්මියාගේ ලග්නය කුමක් වුවත් සෙනසුරු 1-3-5-9-10-11 යන භාවයක උත්පත්තියේ සිටියේ නම් ඔවුන්ටද සෙනසුරු ලග්නයේ ගෝචර වීම තදබල අපල උදා නොවන්නේය.
- ශනි ලග්නයේ දුර්වලව ගමන් කරන කාලයේදී කුජ 7 වැන්නේ ගමන් කරමින් සප්තම දෘෂ්ටි දෙන කාලවලදී කුජ-ශනි දෙදෙනාම ලග්නයේ ගමන් කරන කාලයේදී ඇතිවන ඵල විපාක මීට වඩා හාත්පසින්ම වෙනස් වී යන්නේය.
- ශනි ලග්නයේ ගමන් කරන විට යුරේනස්ගෙන් සම සප්තම දෘෂ්ටිය ලැබුවේ නම් බලාපොරොත්තු රහිත පවුල් භේද ඇතිවීම, සතුරු පීඩා, නඩුහබ ඇතිවිය හැකිය.
- ශනිට යුරේනස්ගේ ත්‍රිකෝණ දෘෂ්ටිය ලැබුණේ නම්, හදිසි උසස්වීම්, ලාභ ලැබෙන ගමන් යෙදීම, ඉගෙනීම් සඵලත්වය, දරුවන්ගේ දියුණුව, ස්ථාන මාරුවී කරදර අඩුවීම, කරන වැඩවල ශුභ ඵල අත්විඳීම සිදුවනු ඇත.

ලග්නයට ශනිගේ ගෝචරය මේ ආකාරයට බල දුබලතාවන් ඇතිකළද ඒ සඳහා නිවැරැදි ධර්මානුකූල ජීවිතයක් ගතකරන ජන්මියාට එම අහිතකර කිරණයන්ගේ චලනය පවා වෙනස් කරගත හැකිය.

නැවතත් මෙවන් හරවත් ලිපි පෙළකින් ඔබව දැනුවත් කිරීමට මා සූදානම්. එතෙක් ඔබට සියලු යහපත උදාවේවා.

**ජෝතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති**



*ජ්‍යොතිර් විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අවිශ්කාර් විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, සෙත්කවි ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී*
*සංජීවී ජ්‍යොතිර් පියස*
*දුරකතන - 0777 130391*
*ලිපිනය - ජයශ්‍රී, අංක 101, විමුක්ති මාවත, තුන්වැනි පටුමග, තලංගම උතුර, බත්තරමුල්ල.*

# කවුරු වුණත් කමක් නෑ මාලනීව විකුණගෙන කන්න ලෑස්ති වෙන්න එපා



**යම් කෙනෙක් විසින් තවත් කෙනකුට ලියපු ලියුමක් කියවන එක හෝ ඒ ලියුම කියවන්නැයි කියලා වෙනත් කෙනකුට බලකරන එකද සදාචාරාත්මක දෙයක් නෙවෙයි. හැබැයි ලියන්න සූදානම් වන මේ සටහනට පසුබිම් වෙලා තියෙන පසෙකින් දැක්වෙන 'අනුන්ගේ ලියුම් දෙක' නම් දැනටමත් බොහොමයක් දෙනා, එහෙමත් නැත්නම් සිය ගණනකට වැඩිය කියවලා අහවරයි. සෝෂල් මීඩියාවල පවා ඒ ලියුම පසුගිය දවස්වල හෝග ාන සද්දෙට වයිරල් වෙලා තිබුණා. ඒ වගේම සුවිශේෂ පුද්ගලයන් දෙදෙනකු අතර වුණු ඒ ලියුම් හුවමාරුව ලෙහෙසි පහසු ගනුදෙනුවකුත් නෙවෙයි. ලියුම් යවන්නේ ලංකාවේ ජනප්‍රියම ප්‍රවීණ කලාකාරියන් දෙදෙනකු වූ දමයන්ති ෆොන්සේකා සහ සමනලී ෆොන්සේකා. ලියුම් ලබන්නා වෙන්නේ ලංකාවේ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු සහ දානපතියකු වූ නවලෝක සමූහ ව්‍යාපාරයේ අධිපති ජයන්ත ධර්මදාසයි. ලියුම් හුවමාරුවට මුල් වන්නේ හෙළයේ නිළි රැජින මාලනී සෙනෙහෙලතා ෆොන්සේකාගේ ජීවිත කතාව අලළා නිර්මාණය වන 'රැජිනියේ' චිත්‍ර පටයයි.**

'රැජිනියේ' චිත්‍රපටය අධ්‍යක්ෂණය කරන්නේ ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ අරුණ ජයවර්ධනයි. නිෂ්පාදන මෙහෙවරට අතපොවලා තියෙන්නේ ජයන්ත ධර්මදාසයි. 'රැජිනියේ' සිනමා නිර්මාණයේ මුහුරත් උළෙල තියන්නත් පළමුව මාලනී ෆොන්සේකාගේ චරිතාපදාන සිනමාවට නගන්නයි සූදානම කියන පණිවුඩය සමාජ සහ මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රසිද්ධ වනවිට සිනමා ලෝලීන් මුහුණු පොත හරහා එයට දුන් ප්‍රතිචාරවල වැඩි හරියක්ම තිබුණේ මනාපයක් නැති සටහන් සහ සිනමා නිර්මාණයට විරුද්ධව දැක්වූ අදහස් සමූහයකි. 'මාලනියගේ ප්‍රතිරූපයට එය හානියක්. වහාම ඔය අදහස ඔබේ සිතින් අයින් කරන්න...'

'මාලනිය කියන්නේ හෙළ සිනමාවේ නිළි රැජින. ඇයට ඇගේ පාඩුවේ ඉන්න දෙන්න. එයයි ගෞරවය...' 'රැජිනක් වැනි වූ ඇගේ පෙනුමට සමාන නිළියක් කොහෙන් හොයන්නද...? අනේ ඇයට අපහාස කරන්න එපා...' 'ජයන්ත ධර්මදාස... මේ ඔබටයි කියන්නේ. තව සල්ලි ගරන්න ඕනෑ නම් වෙන බිස්නස් එකක් තෝරාගන්න. හෙළ නිළි රැජිනව විකුණගෙන කන්න එපා...'

'රැජිනියේ' චිත්‍රපටය නිර්මාණය කරන්න යනවයි කියන සූදානම වෙනුවෙන් මුහුණු පොතෙහි සටහන්ව තිබුණු අදහස් ගණනක් කමෙන්ට්වල වැඩිපුරම තිබුණේ එවැනි අදහස්ය. තමා ලොකු මෙහෙවරක් හෝ වීරකමක් කරන්න යනවා යැයි කියා සිතූ නවලෝක සමූහ ව්‍යාපාරයේ අධිපතිතුමා එකී ප්‍රතිචාර කිසිසේත්ම බලාපොරොත්තු නොවන්නට ඇත. සමහර විටෙක ඔහු සිතන්නට ඇත්තේ 'රැජිනියේ' චිත්‍රපටය නිර්මාණය කිරීමේ මෙහෙවර වෙනුවෙන් ඔහුට විශාල ප්‍රශංසාවක් ලැබෙනු ඇතැයි කියාය. වගකිව යුතු පුද්ගලයන්ගෙන් සහ ප්‍රවීණ කලාකරුවන්ගෙන් පවා ඊට යම් විරුද්ධත්වයන් සමග නොපහන් ප්‍රතිචාර ලැබෙන විට ඇතැම් විට ඔහු තක්කු මුක්කු වන්නට ඇත.

'තම ජීවිත කතාව සිනමාවට නගන්නටැයි කියා මාලනිය තමා හමුවේ ඇගේ අවසාන දවස් කිහිපය තුළදී ඉල්ලීමක් කළා යැයි ජයන්ත ධර්මදාස සමාජ මාධ්‍ය ඔස්සේ පවසා තිබුණේ එයට පසුවය. තමා ඉතසිතින් එම ඉල්ලීම ඉටුකරන පොරොන්දුව ඇයට දුන් බවත් ඔහු පවසා තිබිණි. ඇත්තෙන්ම නිළි රැජින මාලනී ෆොන්සේකා ඔහුට එවැන්නක් කිව්වාද නැද්ද කියා දන්නේ ඔහුම පමණි. එවැනි ඉල්ලීමක් කළ බව කියන්න ඉන්න එකම සාක්ෂිකාරයාද ඔහුම පමණය. එයින් එහාට ඒ සිදුවූවාය කියන සංසිද්ධියෙහි සත්‍යය අසත්‍යය දන්නේ ඔහු සහ ඔහුගේ හිත පමණමය. ඊට එහා අයකු වේ නම් මාලනිය සහ උඩ ඉන්න දෙවියන් පමණය.

කොහොම වුණත් ජයන්ත ධර්මදාස ප්‍රවීණ නිර්මාණකරු අරුණ ජයවර්ධනවත් හවුල් කරගෙන තමා හමුවේ ඇති සියලු විරුද්ධත්වයන් නොතකා වැඩේට අතගැසුවේ කවුරු මොනවා කිව්වත් 'රැජිනියේ' චිත්‍රපටය කරනවා කියන පාරට්ටු ප්‍රකාශයද සමගය. සමනලී ෆොන්සේකා සහ දමයන්ති ෆොන්සේකා කතාකරගෙන තිබුණේ 'රැජිනියේ' මුහුරත් උළෙලට සහ රූගතකිරීම්වලට පළමුව තිරපිටපත ගැන සාකච්ඡා කරන්නට එන බව සහ ලිඛිතව එය ඔවුන් වෙත ඉදිරිපත් කරන බවත්ය. තිරපිටපත රැගෙන දමයන්ති ෆොන්සේකාව හමුවීමට පැමිණෙන බව එය රචනය කිරීමේ වගකීම භාරගත් සුනෙත් මාලිංගද පවසා තිබූ බව දමයන්ති ෆොන්සේකා ජයන්ත ධර්මදාසට ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලියමනෙහිද සඳහන්ව ඇත.



එනමුත් 'රැජිනියේ' සිනමා නිර්මාණයෙහි සියලු මුල් වැඩකටයුතු පිළියෙල වී තිබුණේ මාලනියගේ පවුලේ අයව දැනුවත් කොට නොමේය. නිර්මාණය ජනගත කිරීම, නළු නිළියන් තෝරාගැනීම ඇතුළුව සියල්ල සිදුව තිබෙන්නේ ජයන්ත ධර්මදාසගේ හිතු මනාපෙටය. හෙළ රැජිනියගේ චරිතයට මෙන්ම සෙසු චරිතයන් සඳහා තෝරාගත් නළු නිළියන් ගැනද බොහෝ දෙනකුගේ හිත් තුළ ඒ තරමටම මනාපයක් නැති බව සමාජ මාධ්‍ය ජාලවල 'රැජිනියේ' වෙනුවෙන් දක්වන සටහන්වලින් පෙනෙන්නට තිබිණි. නළු නිළියන් තෝරාගෙන තිරපිටපතද සමගින් 'රැජිනියේ' මුහුරත පැවැත්වුණේද මාලනියගේ චරිතය සඳහා තෝරාගත් තාරුකා වන්නිආරච්චිගේ, මාලනියගේ ස්වරූපයට ගන්නා ලද සේයාරූ කලඑළි දැක්මක් පැවැත්වුණේද එම සේයාරූ සමාජ ජාල ඔස්සේ මුදාහැරුණේද නිළි රැජින මාලනී සෙනෙහෙලතා ෆොන්සේකාගේ පවුලේ උදවියගේ අනුදැනුමකින් තොරවය.



දමයන්ති ෆොන්සේකා තම වැඩිමහල් සහෝදරිය වෙනුවෙන් බලය අතට ගන්න සිතුවේ ඒ නිසාය. ජයන්ත ධර්මදාසට කතා කළ ඈ පවසා සිටියේ තිරපිටපත රැගෙන තමා හමුවීමට එන ලෙසය. ඒ සඳහා විධිවිධාන යොදන්නට ඔහු පොරොන්දු විය. සුනෙත් මාලිංග තිරපිටපත ගැන දුරකතනයෙන් පැහැදිලි කරන්නට සූදානම් වූයේද ඒ පොරොන්දුව නිසාම වන්නට පුළුවන. යම් සුවිශේෂ පුද්ගලයකුගේ චරිතාපදානය අලළා සිනමා නිර්මාණයක් කරන විටක එම තිරපිටපතෙහි අනන්‍යතාව දුරකතන සංවාදයක් හරහා තහවුරු කරගන්නට මානබැලීම ඇත්තෙන්ම විහිළුවක් නොවේද? අනේ කාලේ වනේ වාසේ කියන්නේ මෙවැනි විලම්භීතවලටය.

කෙසේ වෙතත් දමයන්ති ෆොන්සේකා තිරපිටපත හැකි ඉක්මනින් රැගෙන තමා හමුවට එන්නැයි සුනෙත් මාලිංගට කීවද ඔහු පැමිණියේ නැත. ජයන්ත ධර්මදාසද ඒ ගැන කතා නැතිව සද්දේ වහලා සිටියේය. ඒ හැම තැනකදීම,

'මොන බලපෑම ආවත් රැජිනියේ චිත්‍රපටය නිර්මාණය කිරීම සඳහා මා පෙරට තැබූ පියවර නැවත පස්සට නොගන්නෙමි..' යැයි කියා හරි උද්දාමයෙන් ජයන්ත ධර්මදාස කිහිප විටක්ම ප්‍රසිද්ධියේ පවසා තිබිණි. 'රැජිනියේ' රූගතකිරීම්ද ආරම්භ විය. මාලනියගේ පවුලේ උදවිය කලකිරීමට සහ කෝපයට පත්වූයේ එතැනදීය. දමයන්ති ෆොන්සේකා සහ සමනලී ෆොන්සේකා සැර පදමට දමා ජයන්ත ධර්මදාසට ලියාපදිංචි තැපෑලෙන් ලියුමක් දැම්මේ බැරිම තැනදීය. අනතුරුව එය සමාජ ජාල වෙබ් අඩවි හරහා ප්‍රසිද්ධ කරන්නට පියවර ගත්තේ 'රැජිනියේ' චිත්‍රපටයේ සියලු වැදගත් අවස්ථාවන් කොළේ වහලා ගහන ගේම් එකකට සම කරන්නට ඔහු උත්සාහ කළ නිසාය.

ජයන්ත ධර්මදාස 'රැජිනියේ' චිත්‍රපටයෙහි තිරපිටපත මාලනියගේ පවුලේ උදවියගෙන් වසං කළේ ඇයි?

මාලනී ෆොන්සේකා මහත්මිය ජීවත්ව සිටි අවසාන දවස් කිහිපය තුළ තම ජීවිත කතාව සිනමාවට නගන අයිතිය ජයන්ත ධර්මදාසට දුන්නා නම් ඒ උණුසුමේම එය ඇගේ අසලින්ම හිටපු සමනලී ෆොන්සේකා සමගවත් කියන්නට ඔහුට නොසිතුණේ මන්ද?

'රැජිනියේ' නිර්මාණය කරන අදහස ප්‍රසිද්ධියේ කී දවසේ ඉඳන්ම ඔහු කටයුතු කළේ උගුරට හොරා බෙහෙත් බොන සෙල්ලම කරන ලෙසින් නොවේද? මාලනිය දැඩි ලෙස රෝගාතුර වූ අවස්ථාවේ ඈ වෙනුවෙන් දිය යුතු සියලු රෝහල් පහසුකම් සුපිරියටම එතුමිය වෙනුවෙන් දුන්නාය කියා 'රැජිනියේ' සිනමා පටය කිසිදු කොන්දේසියකින් තොරව නිර්මාණය කරන්නට මාලනියගේ පවුලේ උදවිය ඔහුට අවසර දිය යුතුද?

ඇතැමුන් මුහුණු පොතෙහි සටහන් කොට තිබුණේ මාලනියගේ ජීවිතයේ අවසාන දවස් කිහිපය තුළ ඔහු සියලු රෝහල් සේවාවන් නොමිලේ තිළිණ දුන්නේ මෙවැනි අරමුණක් සිත කොනක තබාගෙන කියාය. අනෙක මාලනිය ජයන්ත ධර්මදාසට සිය චරිතාපදානය සිනමාවට නැඟීමේ අයිතිය සහ මනාපය තමාට දුන්න බව අඩුම ගණනේ ඇගේ අවමංගල්‍ය කටයුතුවලින් පසුවවත් පවුලේ උදවිය සමග පවසන්නට ඔහුට නොසිතුණු එක පුදුමය. ඒ තරම් සුවිශේෂ අගනා කාරණයක් අමතකව යෑමද පුදුමයකි. 'රැජිනියේ' සිනමා පටය නිර්මාණය කරන අදහස ඔහු විසින් සමාජගත කළ දිනයේ පටන්ම ඊට විරුද්ධ වූ පිරිස අසීමිතය. බොහොමයකගේ අදහස වී තිබුණේද සිංහල සිනමාවේ හෙළ රැජිනියගේ අභිමානයට මෙය අවමානයක් බවය. තෝරාගත් නළු නිළි කැල ගැන හිතන විට වුවද සිනමා ලෝලීන්ගේ, ඇගේ පවුලේ උදවියගේ හෝ මාලනියට ළෙන්ගතු කිසිදුම අයකුගේ මනාපයක් එයට ලැබී තිබුණේ නැත.

සූර බුද්ධියක් ඇති ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වූ ජයන්ත ධර්මදාස හදන්නේ තමාද රටට විහිළුවක් වී මාලනී ෆොන්සේකා නම් අසමසම කලාකාරියගේ ගෞරවනීය ප්‍රතිරූපද විහිළුවක් කරන්නද?

ඇතැමුන් අදහස් දක්වා ඇති ආකාරයට විශිෂ්ට ගණයේ ව්‍යාපාරිකයකු වූ ඔහුට 'රැජිනියේ' නමින් නිර්මාණය වන සිනමා පටය මාලනියගේ අසහාය නාමයට දක්වන උපහාරයකට වඩා තම ව්‍යාපාරික ඇහැට අනුව කදිම ආයෝජනයක් ලෙස පෙනුණා විය හැකිය. එලෙසම මාලනියගේ අවසන් කාලය තුළ ඔහු නොමිලේ දුන් සුපිරි මට්ටමේ රෝහල් පහසුකම් ඒ සඳහා ලද ලයිසන් එකක් විදියටද ඔහුට පෙනුණා වන්නට බැරි නැත.

එතකොට දැන් මේ සියල්ල හමුවේ ඔහුගේ හිතුමතේට වැඩ කරන්නට ඉඩ දී මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගතයුතු වගකිව යුත්තන් නිහඬ විය යුතුද? 'මොන බාධක ආවත් මාලනියට උපහාර වෙනුවෙන් මා ගත් තීරණය 'රැජිනියේ' සිනමා පටය නවත්වන්නේ නැහැ' යැයි කියමින් ඔහු හිතුමතේ දියත් කොට ඇති සැලැස්ම දිගින් දිගට ක්‍රියාත්මක කරන්නට ඉඩ දිය යුතුද?

'වගකිවයුත්තනි, වහා නැගී සිටිනු. ශ්‍රී ලාංකේය සිනමාවේ අසහාය නිළි රැජිනියගේ නම අලෙවි කරන්නට සූදානම් වන මේ නිර්මාණ ව්‍යාපාරය නවතා දමනු...'

කියන්නට ඉතිරිව ඇත්තේ එපමණකි.

**මල්මි කෞෂල්‍යා**




## හොරාගේ අම්මාගෙන්ම පේන අහපු

# ඩොලර් මිලියන දෙකහමාරේ භාණ්ඩාගාර කොල්ලය

**කඩදාසි මත ලියැවෙන සංඛ්‍යාලේඛන සමහර විට හුදෙක් ඉලක්කම් සමූහයක් පමණක් වුවද, ඒ ඉලක්කම් පිටුපස සැඟවී ඇති ඇතැම් කතන්දර රටක සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම නිරුවත් කිරීමට සමත්ය. මෙරට ආර්ථික ඉතිහාසයේ කිසි දිනෙක අසා නොමැති, එහෙත් සමස්ත මහා භාණ්ඩාගාරයම අන්දමන්ද කළ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක සයිබර් කොල්ලයද එවැනිම බිහිසුණු මෙන්ම ලැජ්ජාසහගත කතන්දරයකි. රටක් වශයෙන් ජනතාවගේ බදු මුදලින් සතයෙන් සතය එකතු කර, විදේශ ණය බරින් නිදහස් වීමට මහා භාණ්ඩාගාරය වෙර දරන මොහොතක, රුපියල් කෝටි 75කට අධික පොදු මහජන ධනයක් සයිබර් අපරාධකරුවන්ගේ සාක්කුවලට ගලා ගියේ තාක්ෂණික දෝෂයකට වඩා රාජ්‍ය නිලධාරීන් සතු වූ මහා වගකීම් විරහිතභාවයක සහ අඥානකමක ප්‍රතිඵලයක් ලෙස බව රජයේ මුදල් පිළිබඳ කාරකසභා (COPF) වාර්තාවලින් දැන් මුළු රටටම හෙළිදරව් වී තිබේ.**

මෙම මූල්‍ය ඛේදවාචකයේ සුලමුල දිගහැරෙන්නේ 2025 වසරේ නොවැම්බර් මස අගභාගයේදීය. ශ්‍රී ලංකා රජය විසින් ඕස්ට්‍රේලියානු රජයේ නිල අපනයන ණය ආයතනය (Export Finance Australia) වෙත ගෙවීමට තිබූ ද්විපාර්ශ්වික ණය ප්‍රතිපූරණ වාරිකයක් සඳහා සියල්ල සූදානම් වෙමින් පැවතිණි. ඒ අතරතුර, මහා භාණ්ඩාගාරයේ නිල විද්‍යුත් තැපැල් පද්ධතියට රිංගා ගත් අදෘශ්‍යමාන සයිබර් අපරාධකරුවකු විසින් ව්‍යාජ ඩොමේන් නාමයක් භාවිත කරමින්, ණය මුදල තැන්පත් කළ යුතු නව බැංකු ගිණුම් විස්තර කිහිපයක් මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණි. මෙම ගනුදෙනුවේ තිබූ අසාමාන්‍යතාව මුලින්ම ඉව වැටුණේ ශ්‍රී ලංකා මහ බැංකුවටය. ඕස්ට්‍රේලියානු රජයේ ආයතනයකට ගෙවිය යුතු මුදලක්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබිහි පිහිටි පෞද්ගලික සමාගම් ගිණුම් වෙත යොමුකිරීමට උපදෙස් ලැබී තිබීම මහ බැංකු නිලධාරීන්ගේ දැඩි සැකයට හේතු විය.

ඒ අනුව ක්‍රියාත්මක වූ මහ බැංකුව 2025 නොවැම්බර් 26 වැනිදා මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිතවම දන්වා සිටියේ, අදාළ බැංකු ලිපිනයන් නීත්‍යානුකූල ණයහිමියාගේ තොරතුරු සමග කිසිසේත් නොගැළපෙන බවයි. මෙහි බරපතළ මුදල් විශුද්ධිකරණ අවදානමක් පවතින බැවින්, වහාම සැබෑ ණය හිමියා සම්බන්ධ කරගෙන මෙම ගිණුම් විස්තර නැවත තහවුරු කරගන්නා ලෙස මහ බැංකුව අවධාරණය කළේය. ඕනෑම සාමාන්‍ය මනුෂ්‍යයකුට පවා මෙවැනි අවස්ථාවක ඇති වන සැකය මත, වහාම ඕස්ට්‍රේලියානු රජයේ ආයතනය වෙත නිල දුරකතන ඇමතුමක් හෝ සෘජු ඊමේල් පණිවුඩයක් යවා තොරතුරු විමසීමට තිබුණි. එහෙත් මහා භාණ්ඩාගාරයේ වගකිවයුතු නිලධාරීන් සිදුකළේ මුළු මහත් රාජ්‍ය තාන්ත්‍රික මූල්‍ය පද්ධතියම හිනස්සනසුලු ක්‍රියාවකි. ඔවුන් තමන් වෙත ව්‍යාජ ගිණුම් විස්තර එවා තිබූ සයිබර් වංචාකරුගේ ඊමේල් ලිපිනයටම පණිවුඩයක් යවා, 'මේ ගිණුම් විස්තර නිවැරදිද?' යන්න විමසා සිටියේය.

වංචාකරු ද ඉතා සූක්ෂ්ම ලෙස 'ඔව්, එය නිවැරදියි' යනුවෙන් දුන් පිළිතුර මත පදනම්ව, නිලධාරීහු එම සැකකටයුතු ගිණුම් තොරතුරු නිවැරදි බවට තහවුරු කරගත්හ. මෙය ජනවහරේ එන 'හොරාගේ අම්මාගෙන්ම පේන ඇසීම' බඳු සිනාසෙන්නටද හඬන්නටද නොදන්නා ක්‍රියාවකි.

මේ අඥාන තීරණයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් අබුඩාබිහි බැංකුවක පවත්වාගෙන ගිය Mish Global LLC, LMH Global LLC සහ Sifra Watan Project Management Services යන පුද්ගලික සමාගම් වෙත රාජ්‍ය ධනය මුදාහැරීම ආරම්භ විය. මේ සෑම ප්‍රතිලාභියෙකුම ඕස්ට්‍රේලියාවේ අපනයන ණය ආයතනය ලෙස ව්‍යාජ ලෙස පෙනීසිටිමින් මුදල් සූරාකද්දී, මහා භාණ්ඩාගාරයේ කිසිදු නිලධාරියකු ප්‍රතිලාභීන්ගේ නම් ගළපා බැලීමටවත්, ඕස්ට්‍රේලියානු රජයේ ආයතනයක් වෙනුවට මෙවැනි පුද්ගලික සමාගම්වලට මුදල් ගෙවන්නේ ඇයිදැයි ප්‍රශ්න කිරීමටවත් කටයුතු කළේ නැත.

කතාව එතැනින් නිමා වන්නේ නැත. මේ මහා පරිමාණ සයිබර් කොල්ලය ලෝකයටම හෙළි වන්නට පටන් ගත්තේ ජාත්‍යන්තර මූල්‍ය ක්ෂේත්‍රය හරහාය. 2026 ජනවාරි මස 06 වැනිදා, ලොව ප්‍රමුඛතම බැංකුවක් වන ජේ.පී. මෝර්ගන් චේස් වැළැක්වීමේ කණ්ඩායම විසින්, ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවේ අපනයන-ආනයන බැංකුව වෙත සිදුකිරීමට ගිය තවත් එක් සැකකටයුතු ගෙවීමක් වංචනික එකක් බව හඳුනාගෙන එය වහාම තහනම් කළේය. සයිබර් අපරාධකරුවන් විසින් ඉන්දියාව, බ්‍රිතාන්‍යය, ජර්මනිය සහ බෙල්ජියම වැනි රටවල ණය ප්‍රතිපූරණ

> **2026 ජනවාරි මස 06 වැනිදා, ලොව ප්‍රමුඛතම බැංකුවක් වන ජේ.පී. මෝර්ගන් චේස් වැළැක්වීමේ කණ්ඩායම විසින්, ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවේ අපනයන-ආනයන බැංකුව වෙත සිදුකිරීමට ගිය තවත් එක් සැකකටයුතු ගෙවීමක් වංචනික එකක් බව හඳුනාගෙන එය වහාම තහනම් කළේය.**

ක්‍රියාවලීන්ටද මෙලෙසම ව්‍යාජ ඊමේල් හරහා රිංගීමට උත්සාහ කර තිබූ බව පසුව අනාවරණය විය. ජාත්‍යන්තර බැංකුවක් දුන් මෙම ප්‍රබල අනතුරු ඇඟවීමත් සමග අවදි වූ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, වංචනික ඩොමේන් නාමය හඳුනාගෙන ජනවාරි 09 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර ඒකකයට නිල වශයෙන් පැමිණිලි කළේය. නමුත් මේ කතාවේ ඇති බිහිසුණුම සහ සැකකටයුතුම කූටප්‍රාප්තිය සනිටුහන් වන්නේ ඉන් අනතුරුවය. රටේ ප්‍රධාන විමර්ශන ආයතනයට පැමිණිලි කර, මහාපරිමාණ මූල්‍ය වංචාවක් සිදුවන බව නිල වශයෙන්ම දැන දැනත්, ඉන් දින එකොළහකට පසු, එනම් 2026 ජනවාරි මස 20 වැනිදාද මහා භාණ්ඩාගාරය විසින් අදාළ වංචනික Mish Global LLC ගිණුමටම තවත් ඇමෙරිකානු ඩොලර් 997,799ක මුදලක් ගෙවා දැමීමට කටයුතු කර තිබුණි. හොරකම අතටම හසුවී තිබියදීත්, සොරකම් කරන ලද ගිණුමටම නැවතත් පොදු ධනය මුදාහැරීම පිටුපස ඇත්තේ හුදෙක් නොසැලකිලිමත්කමද, නැතහොත් මහා භාණ්ඩාගාරය ඇතුළතින්ම වංචාකරුවන්ට ලැබුණු අනුග්‍රහයක්ද යන්න බරපතළ ප්‍රශ්නාර්ථයකි.

එපමණක් නොව, මේ මහා මංකොල්ලය පසුපස තවත් අපූරු නාටකයක්ද රඟදැක්වුණි. ජනවාරි මුල් සතියේ ගෙවීමට තිබූ සැබෑ ණය වාරිකය ගෙවීමට නොහැකි වූ තැන, අමාත්‍යාංශ නිලධාරීන් විසින් සැබෑ ඕස්ට්‍රේලියානු ණය හිමියා වෙත විද්‍යුත් තැපැලෙන් පණිවුඩයක් යවමින් කියා සිටියේ, ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සහ සම්පත් හිඟකම නිසා ණය ගෙවීම ප්‍රමාද වන බවයි.

මුදල් ඒ වනවිටත් හොරුන්ගේ ගිණුම්වලට බැරවී අවසන්ව තිබියදී, සැබෑ ණය හිමියාගෙන් තවත් කාලය ඉල්ලා සිටීමට කටයුතු කිරීම පිටුපස නිලධාරීන් තමන් කළ මහා විනාශය වසා ගැනීමට දැරූ බංකොලොත් උත්සාහයක් පැහැදිලිවම පෙනෙන්නට තිබේ.

තාක්ෂණික පැත්තෙන් බැලුවද, ලංකාවේ සමස්ත විදේශ ණය කළමනාකරණය මධ්‍යම බැංකුවෙන් ඉවත් කර මහා භාණ්ඩාගාරය යටතේ අලුතින් පිහිටුවූ 'රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය' වෙත පැවරීමේ සංක්‍රාන්ති සමය තුළ මෙම මහා පරිමාණ වංචාව සිදුව ඇත. මුදල් අමාත්‍යාංශය භාවිත කර ඇත්තේ ආරක්ෂක යාවත්කාලීනයන් පවා අහෝසි වූ, අතිශය යල්පැනගිය Microsoft Exchange Server විද්‍යුත් තැපැල් පද්ධතියකි. මූලික ආරක්ෂණ උපක්‍රමයක් වන Multi-factor Authentication (MFA) වැනි පද්ධතියක්වත් මේ මහා භාණ්ඩාගාරයේ පරිගණක පද්ධති සතුවී නොතිබීම ජාතික මට්ටමේ ඛේදවාචකයකි.

රටක් ආර්ථික වශයෙන් බිඳවැටී, ජනතාව වේලක් හැර වේලක් කමින් බදු බරින් මිරිකෙන මොහොතක, මහජනතාවගේ රුධිරයෙන් සූරාගන්නා ධනය මෙලෙස සයිබර් කොල්ලකරුවන්ගේ සාක්කුවලට යාමට ඉඩහැරීම කිසිසේත් සමාව දිය නොහැකි ජාතික අපරාධයකි. මෙවැනි මහා පරිමාණ ජාතික ධන විනාශයක සෘජු වගකීම මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ මහ බැංකු අධිපතිවරයා ඇතුළු ඉහළම නිලධාරීන් සතු වියයුතු වුවද, මේ වනවිට බිල්ලට දී ඇත්තේ මධ්‍යම මට්ටමේ නිලධාරීන් සිවුදෙනෙකු පමණි.

සමස්ත විදේශ ණය ගෙවීමේ පද්ධතියම වහාම විශේෂ විගණනයකට ලක් කළ යුතු අතර, රටට මෙම විනාශය ළඟා කර දුන්, හොරාට කඬේ ගිය සියලු ඉහළ සහ පහළ නිලධාරීන්ට එරෙහිව තරාතිරම නොබලා උපරිම දඬුවම් පැමිණවිය යුතු කාලය එළඹ ඇත.

*මාර්කස් ප්‍රනාන්දුපුල්ලේ*



**මෙරට ප්‍රථම ඩෙංගු රෝගියා වාර්තා වී ඇතැයි පැවසෙන්නේ 1962 වසරේදීය. අනතුරුව 1965ත් 1968ත් අතර කාලය තුළ ඩෙංගු රෝගීන් 51දෙනෙක් වාර්තා වී ඇති අතර, ඒ කාලය තුළ සිදුව ඇති ඩෙංගු මරණ ගණන 15කි. මේ ආකාරයට 60 සහ 70 දශකවලදී දිවයින පුරා විටින් විට කුඩා පරිමාණයේ ඩෙංගු රෝගී තත්ත්වයන් වාර්තා වී ඇතත් ඩෙංගු වසංගත තත්ත්වයක් බවට පත්වන්නේ 1989 වසරින් පසුවය. 1989 වසරේදී මෙරට ප්‍රථම වරට නිල වශයෙන් ඩෙංගු වසංගත තත්ත්වයක් තහවුරුකර ඇත. එම වසරේ ඩෙංගු රෝගීන් 203 දෙනෙක් රෝහල්ගත කර ඇති අතර මරණ ගණන වාර්තා වන්නේ 20ක් ලෙසිනි. 1990දී තත්ත්වය තවදුරටත් බරපතළ වෙමින් ඩෙංගු රෝගීන් වාර්තා වූ ගණන 1,350ක් වූ අතර මරණ ගණන සටහන් වන්නේ 54ක් ලෙසිනි. 1996දී නැවතත් ඩෙංගු වසංගත තත්ත්වයක් ඇතිවන අතර එහිදී වාර්තාවන රෝගීන් ගණන 1,298ක් වන අතර මරණ ගණන 54කි. 1999 වනවිට රට තුළ ඩෙංගු රෝගීන් ගණන ජනගහනයෙන් ලක්ෂයකට 10ක් ලෙස ඉහළ ගොස් තිබුණි.**

2000 - 2008 අතර කාලයේදී වාර්ෂිකව වාර්තාවන ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සාපේක්ෂව යම් අඩු මට්ටමක පැවතුණි. එහෙත් 2009 වසරේදී නව ඩෙංගු වෛරස් ප්‍රභේදයත් (DENV-1) සමග රෝගීන් සංඛ්‍යාව චක්‍රීයව ඉහළ යාමට පටන් ගෙන ඇත. එම වසරේ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් ගණන 35,007කි. ඩෙංගු රොගීන් ප්‍රමාණය හා සාපේක්ෂව සැසඳීමේදී මෙරට ඉතිහාසයේ වැඩිම ඩෙංගු මරණ අනුපාතයක් වාර්තා වී ඇත්තේ 2009 වසරේදීය. එම වසරේ ඩෙංගු මරණ ගණන 346කි. ඊට පෙර වසරේ ඩෙංගු මරණ වාර්තා වන්නේ 114ක් ලෙසිනි. ඩෙංගු මරණ ගණන 100 ඉක්මවන ඉතිහාසයේ පළමු අවස්ථාව ලෙස සැලකෙන්නේ එම වර්ෂයයි. 2010 වසරේදීද ඩෙංගු රෝගීන් 35,007ක් වාර්තා වූ අතර, සිදුවූ මරණ ගණන 246ක. 2011 වසරේදී ඩෙංගු මරණ ගණන 185කි. එම වසරේදී ඩෙංගු රෝගීන් වාර්තා වී තිබුණේ 28,473ක් බව සෞඛ්‍ය අංශ වාර්තා සඳහන් කරයි. 2012 දී ඩෙංගු මරණ 180ක්ද 2014 වසරේදී ඩෙංගු මරණ 120ක්ද වාර්තා වී ඇත. මෙරට ඉතිහාසයේ දරුණුතම ඩෙංගු වසංගත තත්ත්වයක් වාර්තා වන්නේ 2017 වසරේදීය. ඩෙංගු රෝගීන් 186,101ක් වාර්තා වූ අතර මරණ ගණන 440කි. ඩෙංගු රෝගීන්ගේ ගණන ලක්ෂය ඉක්මවූ පළමු අවස්ථාව වන්නේ මෙයයි. 2017 වසරින් පසු මෙතෙක් ඩෙංගු මරණ 100 ඉක්මවා නැත. එහෙත් 2019 වසරේදී ඩෙංගු රෝගීන්

## විශ්‍රාමිකයන්ටත් ණය ගන්න පුළුවන් DFCC ගරුසරු මුණුපුරන්ටත් වාසියක්

DFCC බැංකුව සිය 'DFCC ගරුසරු' ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් වැඩිදියුණු කළ නව ප්‍රතිලාභයක් හඳුන්වාදී ඇත. මේ හරහා සුදුසුකම් ලබන රජයේ විශ්‍රාමිකයන්ට සහනදායී ණය පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීමට අවස්ථාව ලැබෙන අතරම, 'DFCC Junior' ළමා ඉතුරුම් ගිණුම් හරහා තම දරුවන් සහ මුණුපුරන් වෙනුවෙන් ශක්තිමත් ඉතුරුම් පදනමක් ගොඩනැගීමේ සුවිශේෂ අවස්ථාව ද හිමි වේ.

මෙම වැඩිදියුණු කළ මූල්‍ය ප්‍රතිලාභය මගින්, බොහෝ වැඩිහිටියන් තම පවුල් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම උදෙසා අඛණ්ඩව ඉටුකරන වැදගත් කාර්යභාරය අගය කරනු ලබයි. එහිදී ඔවුන් තම පෞද්ගලික මූල්‍ය අවශ්‍යතා සමබරව පවත්වාගන්නා අතරතුරම, මීළඟ තරුණ පරපුරේ අනාගත සුභසාධනය වෙනුවෙන් දායක වීමට දක්වන උනන්දුව මින් මනාව හඳුනාගෙන ඇත.

මෙම නව වැඩපිළිවෙළ යටතේ, 'DFCC Junior' ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කර නියමිත ඉතුරුම් ඉලක්ක සපුරාලන 'ගරුසරු' ගනුදෙනුකාර භවතුන්ට 0.5%ක් දක්වා වූ සුවිශේෂ පොලී සහන භුක්ති විඳිය හැකිය. තෝරාගත් මූලික තැන්පතු ක්‍රමවේදයක් හරහා හෝ මසකට රුපියල් 2,000ක අවම මුදලකින් ආරම්භ වන පරිදි මාසික ස්ථාවර නියෝගයක් ස්ථාපනය කිරීමෙන් ගනුදෙනුකාර භවතුන්ට මෙම ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලැබිය හැක.



## මෙගාවොට් 18ක බලයක් ඩිමෝ වෙතින් ගාල්ලට සූර්ය බලාගාර 4ක්



DIMO, ගාල්ල දිස්ත්‍රික්කයේ නව සූර්ය බලාගාර හතරක් සාර්ථකව ආරම්භ කරමින් මෙරට ජාතික විදුලි ජාලයට මෙගාවොට් 18ක පිරිසිදු බලශක්ති ධාරිතාවක් එක් කරමින් සිය පුනර්ජනනීය බලශක්ති ආයෝජන තවදුරටත් ශක්තිමත් කර ඇත. රත්ගම සහ අක්මීමන ප්‍රදේශවල පිහිටි මෙම utility-scale සූර්ය බලාගාර, DIMO හට අයත් සම්පූර්ණ අනුබද්ධ සමාගම් මගින් Independent Power Producer (IPP) ව්‍යාපෘති ලෙස සංවර්ධනය කර ඇති අතර, ඒවා මෙරට පුනර්ජනනීය බලශක්ති පුළුල් කිරීමේ ජාතික වැඩපිළිවෙළට ද දායක වේ. මෙම නව ව්‍යාපෘති සමග DIMO හි සම්පූර්ණ සූර්ය බලශක්ති නිෂ්පාදන ධාරිතාව මෙගාවොට් 25.845 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය සමාගමේ දිගුකාලීන තිරසාර බලශක්ති ආයෝජන ගමනේ තවත් වැදගත් සන්ධිස්ථානයක් වෙයි. මෙම බලාගාර හතර එක්ව වසරකට tCO2e 12,945කට අධික කාබන් විමෝචනයක් අඩු කිරීමටත්, පිරිසිදු විදුලි ශක්තිය kWh මිලියන 31.8ක් පමණ නිෂ්පාදනය කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙයින් ගෘහස්ථයන් 37,937කට පමණ විදුලි සැපයුම ලබාදීමට හැකිවීමද විශේෂත්වයකි.

## ලංකා බැංකුව පොසොන් පෝදා අනුරාධපුරයේදී කරපු සත්කාරයන්

**මෙවර පොසොන් පුණ්‍යෝත්සවය නිමිත්තෙන් අනුරාධපුර මහමෙව්නා උයනේ පැවැති වාර්ෂික සති පිරිත් සජ්ඣායනයට සමගාමීව, ලංකා බැංකුවේ බැතිබර දායකත්වයෙන් ආගමික හා සමාජ සත්කාර වැඩසටහන් රැසක් සාර්ථකව සංවිධාන කරනු ලැබිය.**



**පොසොන් පොහොය දිනට පෙර දින රුවන්වැලි මහා සෑය අභියස පැවැති බැති ගී සරණිය, ලංකා බැංකුවේ භක්ති ගීත කණ්ඩායම සහ අනුරාධපුර දිස්ත්‍රික් සිසු දරු දැරියන්ගෙන් සමන්විත භක්ති ගීත කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර, එය බැතිමතුන්ගේ මහත් ආකර්ෂණයට හා ප්‍රසාදයට පත් විය.**

**පොසොන් පොහෝ දිනයේ ජයශ්‍රී මහා බෝ සමීඳුන් අභියස සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට සහ පැමිණි බැතිමතුන් වෙනුවෙන් තේපැන් දන්සලක් සංවිධාන කරනු ලැබූ අතර, මිහින්තලේ පුදබිමේ සිල් සමාදන් වූ උවැසි උවැසියන් සඳහා උදෑසන ගිලන්පස දානයද පිරිනමනු ලැබිය. තවද, තන්තිරිමලේ රාජමහා විහාරස්ථානයේ විදුලි පහන් ආලෝක පූජාව ද ලංකා බැංකුවේ දායකත්වයෙන් පැවැත්විය.**

## මෙසීගේ අස්සන එක්ක ජර්සියක් හිමිකරගන්න RITZBURY ROCCOA වෙතින් මිල කළ නොහැකි වැඩක්

ශ්‍රී ලාංකික පාපන්දු ලෝලීන් වෙත ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට, ජාත්‍යන්තර පාපන්දු තරුවක් වන ලයනල් මෙසී විසින් පෞද්ගලිකව අත්සන් කරන ලද, සැබෑ 2026 ආර්ජන්ටිනා ජර්සියක් හිමිකර ගැනීමට අවස්ථාව එක් වාසනාවන්ත ජයග්‍රාහකයෙකුට උදාවී තිබේ. මෙය, ලොව පුරා මිලියන ගණනක් දෙනා විසින් පාපන්දු ක්‍රීඩාවේ සදාකල් විශිෂ්ටතමයා (The GOAT) ලෙස ගෞරව කරනු ලබන ක්‍රීඩකයකුගේ සුවිශිෂ්ට උරුමය නියෝජනය කරනා මිල කළ නොහැකි අයිතමයක් වනු ඇත.

2026 පාපන්දු ලෝක කුසලානය සම්බන්ධ උද්‍යෝගය පාපන්දු ලෝලී සෑමදෙනකු තුළම පිරී ඉතිරෙමින් පවතින මේ මොහොතේ, Ritzbury Roccoa විසින් පාපන්දු ලෝලීන්ට ලබාදෙන්නේ තවත් එක් සමරු සිහිවටනයක් නොවේ. ලයනල් මෙසීගේ අවසන් FIFA ලෝක කුසලාන සහභාගීත්වය නියෝජනය කරනු ඇතැයි අපේක්ෂා කරන මෙම සැබෑ ආර්ජන්ටිනා ජර්සිය ලෝක පාපන්දු ඉතිහාසයේ තීරණාත්මක අයිතමයක් ලෙසින් හඳුන්වා දිය හැක. මේ මොහොතේදී එය දුර්ලභ අයිතමයක් පමණක් වුවත්, මෙම ජර්සියට තිබෙන ඓතිහාසික වටිනාකම පරම්පරා ගණනාවක් තිස්සේ වර්ධනය වනු ඇත. ඒ




අනුව මෙය සැබවින්ම යම් අයෙකුට ජීවිත කාලයකටම වරක් ලබාගැනීමට භාග්‍යය උදාවෙන මහඟු ත්‍යාගයක් යැයි කිව හැකි වේ.

මෙම සුවිශේෂ ප්‍රවර්ධන වැඩසටහන, 2026 අගෝස්තු 20 වැනි දින දක්වා වලංගු වේ. ඒ අනුව, ශ්‍රී ලාංකේය පාපන්දු ලෝලීන්ට Ritzbury Roccoa චොකලට් එකක් මිලදී ගෙන, එහි තිබෙන QR කේතය ස්කෑන් කිරීමෙන් හෝ Roccoa සමාජ මාධ්‍ය තුළ තිබෙන උපදෙස් අනුගමනය කිරීමෙන්, මෙම තරගය පැවැත්වෙන වෙබ් අඩවියට පිවිසීමට හැකියාව ලැබෙනු ඇත.

## HOME LANDS SKYLINE PENTARA RESIDENCIES ඉදිකිරීම් CHEC පටන් ගනී

Home Lands Skyline සමාගම විසින් කොළඹ 05, තුම්මුල්ල ප්‍රදේශයේ සංවර්ධනය කරනු ලබන, අතිසුඛෝපභෝගී ද්විත්ව කුළුණු සහිත සුවිශේෂ උස් මහල් නේවාසික සංකීර්ණයක් වන 'Pentara Residencies' ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු චයිනා හාබර් ඉංජිනේරු සමාගම විසින් පසුගියදා නිල වශයෙන් ආරම්භ කෙරිණි.




කොළඹ නගරයේ ඉදිරියට එන ප්‍රමුඛතම නේවාසික සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් වූ කැපවීම ප්‍රදර්ශනය කරමින්, CHEC සමාගමේ සහ Home Lands Skyline සමාගමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ව්‍යාපෘති උපදේශකයන්, ආයෝජකයන් මෙන්ම ආරාධිත අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගි විය.

මෙම ව්‍යාපෘතියේ නිල ඉදිකිරීම් සහකරු ලෙස, CHEC සමාගම සිය ඉංජිනේරුමය ශක්තිය, උස් මහල් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සතු සුවිශේෂ ප්‍රවීණත්වය සහ මහා පරිමාණ ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමේ මෙහෙයුම් හැකියාව මේ සඳහා දායක කරනු ඇත.

ව්‍යාපෘතියේ පවතින තාක්ෂණික සංකීර්ණත්වය සහ කොළඹ නගරයේ ප්‍රධානතම නාගරික කලාපයක එය පිහිටා තිබීම සැලකිල්ලට ගත්කල, Pentara Residencies ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට CHEC සමාගමේ දායකත්වය අතිශයින්ම තීරණාත්මක වේ.

අද කාලයේ ගොඩක් දෙනා AI යුගයේ විශ්වකර්මයන් ගැන බොහෝසෙයින් කතාබහ කරනවා. මීට අවුරුදු 250කටත් කලින්, විදුලිය නැතිව ලියන්න පුළුවන් රොබෝ යන්ත්‍රයක් හදලා තිබුණා කිව්වොත් ඔබ විශ්වාස කරනවද? අද මම කියන්න යන්නේ කෘත්‍රිම බුද්ධිය, රොබෝවරු, ස්වයංක්‍රීය යන්ත්‍ර සහ සුපිරි පරිගණක ගැනයි. නමුත් මේ හැම දියුණුවකම මූලාරම්භය කොහේද කියලා හොයලා බැලුවොත්, අපිට යන්න වෙන්නේ 1774 වසරටයි. ඒ කාලයේ විදුලිය භාවිතයක් නොතිබුණු සමයක, බැටරියක්වත් පරිගණක චිපයක්වත් නොමැතිව ලියන්න පුළුවන් රොබෝ යන්ත්‍රයක් නිර්මාණය කරලා තිබුණා. ඒ අපූරු නිර්මාණය තමයි ලෝක ප්‍රසිද්ධ The Writer හෙවත් 'ලියන්නා' නමින් හැඳින්වෙන යාන්ත්‍රික රොබෝව.




# අවුරුදු 2500කට කලින් කම්පියුටර් ගැන හිතලාවත් නැති කාලයේ හදපු

# විශ්වකර්ම රොබෝ ලියන්නා





මේ විස්මිත නිර්මාණය බිහිකළේ ස්විට්සර්ලන්තයේ අතිදක්ෂ ඔරලෝසු නිර්මාණකරුවකු වූ පියරේ ජැකේ-ඩ්‍රොස් (Pierre Jaquet-Droz), ඔහුගේ පුත් හෙන්රි-ලුයි ජැකේ-ඩ්‍රොස් (Henri-Louis Jaquet-Droz) සහ ඔවුන්ගේ සමීප මිතුරා වූ ජීන්-ෆ්‍රෙඩ්රික් ලෙෂෝ (Jean-Frédéric Leschot) යන තිදෙනායි. 1768 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ඔවුන්ට වසර හයක පමණ අඛණ්ඩ කැපවීමක් අවශ්‍ය වුණා. එහි ප්‍රතිඵලය ලෙස 1774 දී ලෝකය හමුවේ ඔවුන් යාන්ත්‍රික මිනිස් රූප තුනක් හඳුන්වා දුන්නා. ඒවා නම් පියානෝව වාදනය කරන The Musician, චිත්‍ර අඳින The Draughtsman, සහ ලියන The Writer යන අපූරු නිර්මාණ තුනයි.

මේ තුනෙන්ම ලෝකය වැඩියෙන්ම මවිත කළේ 'ලියන්නා'යි. සාමාන්‍යයෙන් සෙන්ටිමීටර් 70ක් පමණ උසැති කුඩා පිරිමි ළමයකුගේ හැඩයෙන් නිර්මාණය කර තිබූ මෙම රොබෝ යන්ත්‍රය, ලී පුටුවක වාඩි වී මේසයක් ඉදිරිපිට සැබෑ මිනිසකු මෙන් ලියන ආකාරය අදටත් දකින්න පුළුවන්. එය නිර්මාණය කිරීමට අතින් සකස් කළ කුඩා යාන්ත්‍රික කොටස් දහස් ගණනක් භාවිත කර තිබෙන අතර, ඒවා සියල්ලම ක්‍රියාත්මක වන්නේ ඔරලෝසුවක ඇති කරකවන ස්ප්‍රිං එකක් සහ ඉතා නිරවද්‍ය දැති රෝද පද්ධතියක් මගිනි.

මෙම විශ්වකර්ම ලියන්නාගේ ක්‍රියාන්විතය ගැන කතා කළහොත්, ඔහු තම දකුණු අතේ තිබෙන කුරුළු පිහාටු පෑන තීන්ත මත ගිල්වා, වැඩිපුර තීන්ත සෙමින් ගසා ඉවත් කර, ඉන්පසු අකුරෙන් අකුර ඉතා පිළිවෙළට ලියන්න පටන් ගන්නවා. ලියන අතරතුර ඔහුගේ ඇස් දෙක ලියන අකුරු දිගේ ගමන් කරනවා. හිසත් අතේ චලනයට ගැළපෙන ලෙස මඳක් නැවී නැවී ක්‍රියා කරනවා. ලියන කඩදාසියද අවශ්‍ය පරිදි සෙමින් චලනය වෙනවා. මේ හැම දෙයක්ම සිදුවෙන්නේ කිසිදු විදුලි පද්ධතියක් නොමැතිව, සම්පූර්ණයෙන්ම යාන්ත්‍රික ක්‍රමවේදයක් මතයි.

ඒ කාලයේ තිබූ තාක්ෂණය ගැන හිතන විට මෙය සැබෑ ආශ්චර්යයක්. අද අපි පරිගණකයක හෝ ජංගම දුරකතනයක වචන ටයිප් කරන්නේ මෘදුකාංගයක් භාවිත කරමින්. නමුත් The Writer සතුවත් මෘදුකාංග හා සමාන ක්‍රමවේදයක් තිබුණා. යාන්ත්‍රික මතක පද්ධතියක් භාවිතයෙන් අක්ෂර 40ක් දක්වා වචන තුන් පේළියක් ලිවිය හැකි ලෙස එය පෙර සකස් කළ හැකි වුණා. ඒ නිසාම බොහෝ දෙනෙක් මෙය ලෝකයේ මුල්ම Programmable Machine හෙවත් වැඩසටහන්ගත කළ හැකි යන්ත්‍රවලින් එකක් ලෙස සලකනවා. අද Artificial Intelligence රොබෝ තාක්ෂණය සහ පරිගණක ඉංජිනේරු විද්‍යාව ගැන කතා කරන අපට, ඒවායේ මූලික සංකල්ප මීට සියවස් දෙකහමාරකට පෙරම බිහිවී තිබූ බව මෙම විශ්වකර්ම නිර්මාණය පැහැදිලි කරනවා.

මෙම යාන්ත්‍රික නිර්මාණ තුන යුරෝපය පුරා රජ මාළිගා, ප්‍රභූවරුන් සහ විද්‍යාඥයන් ඉදිරියේ ප්‍රදර්ශනය කෙරුණු අතර, එය ජැකේ-ඩ්‍රොස් පවුලේ ඔරලෝසු නිෂ්පාදන ලොව පුරා ප්‍රචලිත කිරීමටත් විශාල දායකත්වයක් ලබාදුන්නා. එදා ඔවුන්ගේ නිර්මාණ යුරෝපයේ සිට ලන්ඩනය හරහා චීනය දක්වා ප්‍රසිද්ධියට පත්වූ අතර, ඔවුන් චීනයට නොගියත් ඔවුන්ගේ නිෂ්පාදනවල කීර්තිය එරටටත් ළඟා වුණා. වසර ගණනාවකට පසු The Writer රොබෝ යන්ත්‍රය ප්‍රථම වරට බීජිං නගරයට ගෙනගොස් විශේෂ ප්‍රදර්ශනයකදී Jaquet Droz en Chine යන වචන ලියවීමත් ඉතිහාසයේ සුවිශේෂ අවස්ථාවක් ලෙස සැලකෙනවා. අදටත් වසර 250කට වැඩි කාලයක් ගතවී තිබුණත්, මේ අපූරු යාන්ත්‍රික රොබෝ යන්ත්‍රය තවමත් සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. එය ස්විට්සර්ලන්තයේ නියුචැටෙල් (Neuchâtel) කලා හා ඉතිහාස කෞතුකාගාරයේ ඉතා සුරක්ෂිත කර තිබෙන අතර, ලොව පුරා සිටින ඉංජිනේරුවන්, ඉතිහාසඥයන් සහ තාක්ෂණ ලෝලීන් අදටත් එය දැක විස්මයට පත්වෙනවා.

මේ සියල්ලටම මගපෙන්වූ බුද්ධිමත් සිතුවිලි සහ නිර්මාණශීලීත්වය මීට සියවස් දෙකහමාරකට පෙර විදුලියවත් නොමැති යුගයක, සම්පූර්ණයෙන්ම යාන්ත්‍රික ක්‍රමවේදයක් මත මිනිස් ක්‍රියාවන් අනුකරණය කළ මේ 'ලියන්නා', මිනිස් නිර්මාණශීලීත්වයට සීමාවක් නොමැති බව ලෝකයට ඔප්පු කළ අමරණීය විස්මිත නිර්මාණයක් ලෙස ඉතිහාසයේ සදාකාලිකවම සටහන් වී තිබෙනවා.



ඊ.ඩී. චමත්



# අයර්ටන් විසඳපු අභයගිරි-ජේතවන පටලැවිල්ල

'නැගෙනහිර ඉන්දියාවේ කාලිංග දේශයේ සිට පැමිණි කාලිංග මාඝ (ඉතිහාසයේ කෲර මාඝ ලෙසද හැඳින්වේ) එවකට ලංකාවේ පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍ය රජුව පරාජය කරමින් මෙරට බලය අල්ලා ගත්තා. ක්‍රි.ව. 1215 සිට 1255 දක්වා පැවැති ඔහුගේ පාලන කාලය ලාංකීය ඉතිහාසයේ අතිශය පීඩාකාරී යුගයක් වුණා.

**ශ්‍රී ලංකාවේ ඉතිහාස පිටු අතර හමුවන දුක්ඛිතම සහ අඳුරුතම පරිච්ඡේදය ලියැවෙන්නේ ක්‍රිස්තුවර්ෂ 1215දීයි. ඒ, කාලිංග මාඝගේ දරුණු ආක්‍රමණයත් සමග මුළු මහත් රජරට ශිෂ්ටාචාරයම සුනුවිසුනුවී යාමත් සමගයි. එතෙක් ලෝකයම මවිත කළ අපේ මහා වාරි පද්ධතිය විනාශ වී ගිය අතර, වැව් දියෙන් පෝෂණය වූ සශ්‍රීක රජරට මුළුමනින්ම වාගේ ජනශූන්‍ය කැලෑවක් බවට පත්වුණා. මධ්‍යතන යුගයේ සිදුවූ මේ මහා ඛේදවාචකය නිසා ශතවර්ෂ ගණනාවක් යනතුරුම මෙරට උතුරු ප්‍රදේශය මහා වනයට බිලිවී පැවතුණා.**

නැගෙනහිර ඉන්දියාවේ කාලිංග දේශයේ සිට පැමිණි කාලිංග මාඝ (ඉතිහාසයේ කෲර මාඝ ලෙසද හැඳින්වේ) එවකට ලංකාවේ පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍ය රජුව පරාජය කරමින් මෙරට බලය අල්ලා ගත්තා. ක්‍රි.ව. 1215 සිට 1255 දක්වා පැවැති ඔහුගේ පාලන කාලය ලාංකීය ඉතිහාසයේ අතිශය පීඩාකාරී යුගයක් වුණා. වෙහෙර විහාර විනාශ කරමින් රටේ සෙල්ලිපි සහ පොත්පත් ගිනිබත් කරමින් කළ මාඝගේ කෲර පාලනයෙන් බේරීම සඳහා රජරට වැසියන් දකුණ බටහිර සහ මධ්‍යම කඳුකර ප්‍රදේශ කරා සංක්‍රමණය වීමට පටන් ගත්තා.

අනුරාධපුරය සහ පොළොන්නරුව කේන්ද්‍ර කරගත් 'රජරට' රාජධානියේ බලය හෙබැවූ අවසන් පාලකයා වූයේ මාඝයි. ඉන්පසුව බලයට පත්වූ සෑම සිංහල රාජවංශයක්ම දඹදෙණිය, යාපහුව, කුරුණෑගල සහ කෝට්ටේ වැනි දකුණු දිශානුගත ප්‍රදේශ කරා තම අගනුවරවල් රැගෙන යාමට මේ තත්ත්වය සෘජුවම බලපෑවා. කෘෂිකර්මාන්තයේ හදවත බඳුවූ වැව් පද්ධතිය අතහැර දැමීම නිසා වැව් ආශ්‍රිතව ඉතිරි වූ සුළු පිරිස හැරුණු කොට මුළු රජරටම මහ වනයෙන් වැසී ගියා.

මුළු අනුරාධපුර පුරවරයම මහා වනයට සහ වන සතුන්ට බිලිවෙද්දී බෞද්ධ ජනතාවගේ ජීවය බඳු වූ 'ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ' පමණක් අඛණ්ඩව ආරක්ෂා වීම ආශ්චර්යයකි. ක්‍රි.පූ. 3 වැනි සියවසේදී දේවානම්පියතිස්ස රජු දවස සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ විසින් ලංකාවට වැඩම කරවන ලද බෝධීන් වහන්සේ ලෝකයේ මිනිස් අතකින් රෝපණය කර ආරක්ෂා කරන ලද පැරණිතම ඓතිහාසික වෘක්ෂයයි.

රට ජනශූන්‍ය වී අනෙකුත් මහා වෙහෙර විහාර මහ වනයෙන් වැසී යද්දී පවා දිවි පරදුවට තබා වන සතුන්ගෙන් සහ සතුරන්ගෙන් බෝධීන් වහන්සේ ආරක්ෂා කරගැනීමට කැප වූ 'විල්බාගෙදර' වැනි වීර පරම්පරාවන් සහ ධීර වීර සඟ පරපුරක් 18 වැනි සියවස දක්වාම අනුරාධපුරයේ රැඳී සිටි බව ඉතිහාසයේ සඳහන් වනවා. 19 වැනි සියවසේදී බ්‍රිතාන්‍ය පාලන සමයත් සමග අනුරාධපුරයේ නටබුන් සොයා කැණීම් කිරීම සහ ඉතිහාසය යළි ගොඩනැගීම ආරම්භ වුණා. නමුත් එහිදී බරපතළ ගැටලුවක් මතුවුණා. ඒ වනවිට මෙරට වැසියන් සහ නිලධාරීන් විසින් අනුරාධපුරයේ තිබූ දැවැන්තම ස්ථූප දෙකක් පටලවාගෙන තිබීමයි. ඔවුන් අභයගිරිය ලෙස හැඳින්වූයේ සැබෑ ජේතවනයයි. ජේතවනය ලෙස හැඳින්වූයේ සැබෑ අභයගිරියයි. මෙම නාමකරණයේ ව්‍යාකූලත්වය විසඳීමට බ්‍රිතාන්‍ය ඉතිහාසඥයන්ට සහ පුරාවිද්‍යාඥයන්ට විශාල වෙහෙසක් දරන්නට සිදුවුණා.

එවක රාජකීය ආසියාතික සමිතියේ ලංකා ශාඛාවේ ලේකම්වරයා වූ හියු නෙවිල් මහතා 1886 අප්‍රේල් 23 වැනි දින රජයට ලිපියක් යවමින් දැනට පවතින නම්කිරීම් වැරදි බවත්, සත්‍ය ජේතවනය කුමක්දැයි හෙළිකිරීමටත් උත්සාහ කළා. ඔහු මහාවංශයේ කරුණු පදනම් කරගනිමින් 1887 දී 'සිලෝන් ලිටරරි රෙජිස්ටර්' (Ceylon Literary Register) සඟරාවට වටිනා ලිපියක් ද සම්පාදනය කළා.

මේ අතරතුර එස්.එම්. බරොස් මහතා විසින් එවකට (වැරදියට) ජේතවනය ලෙස හැඳින්වූ ස්ථූපයේ (සැබෑ අභයගිරියේ) බටහිර වාහල්කඩ අසල තිබූ සුන්බුන් ඉවත් කළා. එහිදී ඔහුට වටිනා ගල් කරඬු දෙකක් හමු වුණා. එහි පිටත සටහන් කර තිබුණේ 'මළුතිස' (කනිට්ඨ තිස්ස) රජුගේ (ක්‍රි.ව. 164-192) බිසව සහ මැණියන් විසින් මේවා නිදන් කළ බවයි.

ප්‍රකට ඉංජිනේරුවෙකු සහ ඉතිහාසඥයෙකු වූ එච්. පාකර් මහතා මෙයට අපූරු තර්කයක් ඉදිරිපත් කළා. ජේතවන ස්ථූපය ඉදිකළේ ක්‍රි.ව. 3 වැනි සියවසේ විසූ මහසෙන් රජු විසිනුයි. මහසෙන් රජුටත් සියවසකට පෙර විසූ මළුතිස රජුගේ මැණියන් තවමත් හදා නැති ජේතවන ස්ථූපයක කරඬු නිධන් කරන්නේ කෙසේද?

එම නිසා බරොස් මහතාට කරඬු හමුවූ එවක ජේතවනය යැයි වැරදියට හැඳින්වූ ස්ථූපය නිසැකවම ඊට වඩා පැරණි අභයගිරි ස්ථූපය විය යුතු බව පාකර් මහතා තහවුරු කළා. මේ පටලැවිල්ල සම්පූර්ණයෙන්ම විසඳුණු ස්ථිර සාක්ෂිය හමුවුණේ 1914 දී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ඊ.ආර්. අයර්ටන් මහතා සිදුකළ කැණීම්වලිනුයි. අභයගිරි ආරාම සංකීර්ණයට අයත් රත්නප්‍රසාද භූමියෙන් සෙල්ලිපියක් හමුවූ අතර, එහි 'උතර මහ චෙත' (උත්තර මහා චෛත්‍යය) යන නම සඳහන්ව තිබුණා. පැරණි පොත්පත්වල අභයගිරි දාගැබ හඳුන්වා ඇත්තේ 'අභයගිරි උත්තර මහා චෛත්‍ය' ලෙසයි. මේ අනුව එතෙක් ජේතවනය ලෙස හැඳින්වූයේ සැබෑ අභයගිරිය බවත් අභයගිරිය ලෙස හැඳින්වූයේ සැබෑ ජේතවනය බවත් නිල වශයෙන්ම තහවුරු වුණා.

මෙම දීර්ඝ පර්යේෂණ වැලක අවසාන ප්‍රතිඵලය සහ නිවැරදි විග්‍රහය සම්මානිත මහාචාර්ය ටී.ජී. කුලතුංග මහතා විසින් රචිත 'පුරාණ අභයගිරි විහාරය' කෘතියේ ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා.

අභයගිරි විහාරය යනු හුදෙක් ආරාමයක් පමණක් නොවෙයි. එය ලෝක ප්‍රකට චීන ජාතික ෆාහියන් හිමියන් පවා පැමිණි මහායාන සහ ථේරවාද බෞද්ධ චින්තනයන් එක ලෙස විවාදයට ලක්වූ ආසියාවේ විශාලතම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් බඳුවූ ආයතනයක්.

වරෙක ඊජිප්තුවේ පිරමීඩවලට පමණක් දෙවැනි වූ මේ මහා ගඩොල් ස්ථූප සෙවණේ දහස් ගණන් දේශීය විදේශීය යතිවරයන් වහන්සේලා ධර්මය හැදෑරුවා. කාලිංග මාඝ අපේ රජරට ශිෂ්ටාචාරය පොළොවට සමතලා කර දැමුවද වසර සිය ගණනකට පසු 19 සහ 20 වැනි සියවස්වලදී හියු නෙවිල්, බරොස්, පාකර් සහ අයර්ටන් වැනි විදග්ධ පර්යේෂකයන් නිසා අපේ ඉතිහාසයේ සැඟවුණු සත්‍යය යළි මතු කරගැනීමට අපට හැකි වුණා. මහාචාර්ය ටී.ජී. කුලතුංගයන් වැනි විද්වතුන් ඒ මතකය අනාගත පරපුර වෙනුවෙන් ග්‍රන්ථාරූඪ කළා. අද වනවිට ලෝක උරුමයක් වන අනුරාධපුරයේ අභිමානයෙන් නැගී සිටින අභයගිරිය සහ ජේතවනය දෙස බලන ඔබ ඒ දැවැන්ත ස්මාරක පිටුපස ඇති මෙවැනි ඓතිහාසික කතාන්දරත් මතකයේ තබාගනු ඇතැයි විශ්වාස කරනවා



CHAMATH VLOGS